*මෙතෙක් කතාව*

*ප්‍රසිද්ධ රංගන ශිල්පිණියක වන නිරාශා විවාහ වී සිටින්නේ පෙරළිකාර චිත්‍රපට අධ්‍යක්ෂ වරයකු වන විදුල මුණසිංහ සමගින් ය. තදින් මත් ද්‍රව්‍ය වලට ඇබ්බැහි වී සිටින මදාරා වෛද්‍යසේකර විදුලට හමුවන්නේ ඔහු සේවය කළ රාජ්‍ය නොවන සංවිධානයට අයත් පුනරුත්ථාපන නිවස්නයකදී ය. සරසවියේ අවසන් පරීක්ෂණයෙන් ඉහළ ලකුණු ලබා දෙන බවට දුන් පොරොන්දුව මත මදාරා විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරයකු වන තිසර සූරියබණ්ඩාරතිසරගේ කාමරයට යයි. ඇය විනාශ කර දමන තිසර නිසා ඇය මත්ද්‍රව්‍ය ගන්නට පෙළැඹෙයි. මදාරා ගේ කතාව දැනගන්නා විදුල ඒ අනුසාරයෙන් සිනමා පටයක් සඳහා තිරනාටකය ලියයි. විදුල හා එකට සරසවි අධ්‍යාපනය ලැබූ අමාත්‍යාංශයක ලේකම්වරියක වන සමදරා විජේසුන්දර ඇගේ ඇමතිවරයාගේ වාර්තා චිත්‍රපටයක් විදුල ලවා නිම කරවා ගැනීමට වෙහෙසෙයි. විදුල එය ප්‍රතික්ෂෙප කරයි.*

ජගත් ජේ එදිරිසිංහ

# කටු 6



*අද එතැන් සිට*

නිරාෂා අවදි වුණේ පාරේ ඈත කෙළවරක බල්ලෙකු ගේ උඩුබිරීම් හඬක් නිසාවෙනි. වැතිර සිටිමින් ම හිස හරවා බැලූ ඇයට විදුල තවමත් ඇඳට පැමිණ නැති බව පෙනුණි. විදුල ගේ කන්තෝරු කාමරයේ විදුලි බල්බයේ එළිය සාලය හරහා වැටී නිදන කාමරයටත් හිස පොවයි.

නිරාෂා ඇඳෙන් නැගිට සාලය හරහා විදුලගේ කාමරයට ඇවිද ගියා ය. කාමරයට ඇතුල් වන්නටත් පෙරම සිගරට් සුවඳ ඇයට දැනුණි. ඔහු තවමත් අවදියෙනි.

"පිස්සා.. මොකද මේ නිදාගන්නෙ නැතුව ඇවිදින්නෙ..?" කාමරයට කර පොවන ඇය

"ඉවරයිද..?" ඈ ඇසුවා ය.

"හ්ම්.. ඉවරයි.."

"අන්තිමට මොකද වුණේ..?"

ඔහු නිහඬව කල්පනා කරමින් සිටියේ ය. තිරනාටකයේ අවසානය ලිව්වේ දැන් පැයකට පමණ කලින් ය. ලියා අවසන් කර, මනසින් සජීවීකරණය කරමින් සිටියේ ද ඒ අවසන් ජවනිකාව ය. ඒ ජවනිකාවේ දෙබස්, රංගන ශිල්පීන් දර්ශන තලයේ පිහිටුවන ආකාරය, කැමරා කෝණ විදුලගේ මනසේ ඇඳෙන්නේ මහත් තෘප්තියක් ගෙන දෙමින් ය.

"අන්තිමට මොකද වුණේ ළමයෝ..?" නිරාශා නැවත අසන්නේ ඔහුගේ නිහඬතාව තවත් ඉවසා සිටිනු බැරි තැන ය.

දකින ඔහු අසන්නේ බොමින් තිබූ දුම්වැටිය අලු බඳුනට ඔබන අතරය. ඔහු සතුටින් සිටින්නේ යයි ඇයට සිතුණි. ඈ කතාවකින් තොරව ඔහු පිටුපසින් විත් දෙවුර උඩින් දෑත් දමා නිකට ඔහුගේ හිස මත තැබුවා ය. මේසය මත දිග හැර ඇති තිර නාටකය මේ ඉරියව්වේදී ඇයට හොඳින් පෙනෙයි. ඔහු දිගහැර ඇති කොලයේ අවසන හරහට ඉරක් ඇඳ ඇත. ඒ, කතාවේ අවසානය විය යුතු ය.

"සාරංගා අමරසූරිය නම් වන විශ්ව විද්‍යාල ශිෂ්‍යාව කථිකාචාර්ය නිශ්ශංක කරුණාසේකරට වෙඩි තියනවා.."

" වෙඩි තියනවා..? ඇයි..? පළිගන්න..?"

"නැහැ.. මේ වෙච්ච සියලු සිදුවීම් විසින් ඇයව ඒ ක්‍රියාව සඳහා පොළඹවනු ලබනවා.. එයා වෙන විකල්පයක් නැති තැනකට තල්ලු වෙලා යනවා.. නිශ්ශංක කියන්නෙ පුද්ගලයෙක් විතරයි.. එයාට එරෙහි වීමෙන් සමස්ත ක්‍රියාවලිය නිවැරදි නොවන බව සාරංගා දන්නවා.. වෙනස් කළ යුත්තේ සමස්ථය බව එයා දන්නවා.. ඒත් ඒ ගැන යමක් කරන්න හිතන්නවත් ඉස්සෙල්ලම එයා අතින් නිශ්ශංක මැරෙනවා.."

"විකෘති සමාජයක එක් මිනිහෙක්ගෙ භූමිකාව අවසන් කළා කියලා සමස්ථ සමාජය පිරිසිදු වෙන්නෙ නැහැ තමයි.. එක නිශ්ශංක කෙනෙ-ක්ගෙ තැන ගන්න තවත් නිශ්ශංකලා ඕනෙ තරම් බිහි වෙනවා විදුල.."

"ඒක සාරංගා දන්නවා.. ඒකයි මං කිව්වෙ එයා අතින් නිශ්ශංක මිය යාමෙන් සමාජය නැවත ප්‍රකෘති තත්වයට එන්නෙ නැහැ කියලා.. ඒත් මේ කතාවේ සිදුවීම් එක්ක කල්පනා කරනකොට සාරංගා ඒ තැනට තල්ලු වුණ එක අසාධාරණ නැහැ කියලයි මට හිතෙන්නෙ.. සාරංගා මුලින්ම කථිකාචාර්යවරයගෙ කාමරයට යන්නෙ කැමැත්තෙන්.. ඒත් කථිකාචාර්යවරයා සූක්ෂම ලෙස එයාව තමන්ගෙ අවශ්‍යතා සඳහා යටපත් කරගන්නවා.. එයාව මත් ද්‍රව්‍ය වලට යොමු කරනවා.. ඇගේ ආත්මය උදුරා ගන්නවා.. අධ්‍යාත්මිකව ඇය මරා දමනවා.. මේ හැමදේටම එරෙහිව දුර්වල ගැහැණියකට කරන්න පුලුවන් දේ තියෙන්නෙ බොහොම ටිකයි.. සාරංගා අතින් නිශ්ශංක වෙඩි කන්නෙ ඇගේ ශක්තියටමද කියන එක මටත් තාම හිතාගන්න බැහැ.. ඒ ප්‍රශ්නාර්ථය එහෙමම ඉතිරි කරන්න මම කැමතියි.."

"කොහොමත් තනි පුද්ගලයෙකුට සමස්ථය වෙනස් කරන්න බැහැනෙ.. ඒ සඳහා කැපවුණ විශාල සමාජ ව්‍යාපාරයක් ඕනෙ.. ගාමක බලවේගයක් ඕනෙ.. අපට තියෙන්නෙ හරිම නිදා වැටෙන සමාජයක්නෙ."

"ඔව්.... ඒ නිසා තමයි මේ හැම සිදුවීමකින් පස්සෙම හිස් තැනක් ඇති වෙන්නෙ.. මට අවශ්‍ය මිනිස්සු ලවා මේ ගැන සාකච්ඡා කරවන්න.. කඩතුරාවෙන් වහගෙන ඉන්න ඊනියා සද්සමාජය ප්‍රශ්න කරන්න.. මේ වගේ චිත්‍රපටියකින් මට කරන්න පුලුවන් වැදගත්ම දේ ඒ සාකච්ඡාව සඳහා පසුබිමක් හදන්න එක.. උත්තේජනයක් දෙන එක... පෙළඹවීමක් කරන එක."

නිරාශා විදුල වෙතින් මෑත්වුණා ය. ඔහුට මුහුණ ලා සිටගත්තා ය. ඇගේ කල්පනාවෙන් බර වූ දෑසේ බැල්ම විසල් බරක් සේ ඔහුට දැනුණි. ඈ මේසය මත වූ ඔහුගේ දෑත තම දෑතින් වසා ගත්තාය.

"වෙනද වගේම අදත් මට ඔයා ගැන බය හිතෙනවා මහත්තයෝ...." ඈ පහත් හඬින් කීවා ය. "..මේ වගේ විවාදාත්මක දේවලට ඔයා අත ගහනකොට මගේ හිත ගිනි ගන්නවා.. මේක හොඳ සමාජයක් නෙවෙයි-නෙ.. ඇත්ත කතා කරන මිනිහ විනාශ කරන්න විවිධාකාර බලවේග හැම තැනම.. අවංක මිනිහෙක් ඇඟිල්ල දික් කරලා වරදක් පෙන්නුවාම මිනිස්සු බලන්නෙ වරද දිහා නෙවෙයි.. ඇඟිල්ල දිහා... ඒ ඇඟිල්ල අයිති පුද්ගලයා දිහා... අනේ මං ආයෙම කියන්නං.. කරන දෙයක් හුඟාක් පරිස්සමින් කරන්න විදුල.. අපි එක වතාවක් මට්ටු වුණ මිනිස-"සුනෙ.."

මෙය පසුගිය කාලය පුරා සිය දහස් වරක් අසා ඇති කතාවකි. ඕනෑ තරම් සාකච්ඡා කර ඇති මාතෘකාවකි. විදුල පිළිතුරක් ලෙස යමක් කියන්නට උත්සාහ නොකළේ ය. මේ කතාව දිගටම ඉදිරියට ගෙනයන්නට සිතක් ඔහුට නැත. "තේ එකක් බොමුද..?" යි ඔහු ඇසුවේ එනිසා ය. නිරාශා සිනාසුණා ය.

"මගේ කතාවට නියම බ්‍රේක්පාරක් නේද ගැහුවෙ..?"

0000000000

ජයන්ත ගේ පක්ෂ කාර්යාලයේ බිත්තියේ සවිකර ඇති කාල් මාක්ස් ගේ විශාල සේය-ාරුව දෙස විදුල ජයන්ත ගේ උරහිසට උඩින් බලා සිටියේ ය. විදුල දන්නා කාලයේ සිටම ඒ සේයාරුව ඒ ආකාරයට ම මේ බිත්තියේ සවි වී තිබුණි. වෙනසකට ඇත්තේ දැන් එය මදක් දුර්වර්ණ වී තිබීම පමණකි.

"විදුල ආයෙම දෙබරේකට ගල් ගහන්ඩයි යන්නෙ.." ජයන්ත විදුල ගේ අනිමිසලෝචනය බිඳිමින් කියයි. ඉස්සර ජයන්ත විදුල ඇමතුවේ "විදුල සහෝදරයා" කියා ය. දැන් ඒ ආමන්ත්‍රණය වෙනස් වී ඇත්තේ මන්දැයි විදුල නොදනියි. වෙනස සිදුව ඇත්තේ